2019 අංක 01 දරන විස්තර සටහන

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

2019 ජූලි 18

**සංචාරක කර්මාන්තය සඳහා සහන සලසාදීම දැක්වෙන**

**2019 අංක 01 දරන චක්‍රලේඛයේ අර්ථ දැක්වීම**

සංචාරක කර්මාන්තයට සහන සලසාදීම පිළිබඳ 2019 මැයි 21 දින නිකුත් කල 2019 අංක 01 දරන චක්‍රලේඛය සම්බන්ධ අර්ථ දැක්වීම් පහත පරිදි වේ.

1. **ලියාපදිංචිය**

(i) 2019 අංක 01 දරන චක්‍රලේඛයේ ඇමුණුම I අනුව දැනටමත් කිසිදු ආයතනයක ලියාපදිංචි නොවූ සංචාරක ව්‍යාපාර අංශය සඳහා සේවා සපයන පුද්ගලයන් සහ ආයතන සහන කාලය ලබා ගැනීම බලාපොරොත්තු වන්නේ නම් දැන් ශ්‍රී ලංකා සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි විය යුතුය.

2. **සහන කාලය අනුමත කිරීම**

(i) 2019.04.18 දින වන විට සක්‍රිය ණය පහසුකම් සඳහා (මුල් මුදල සහ පොළී මුදල) සුදුසුකම් ලත් පුද්ගලයන් හෝ ආයතන (මෙයින් මතු සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් ලෙස හඳුන්වන) සඳහා සහන කාලය සලසා දිය යුතුය. කෙසේ වුවත්, එම සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් මුල් මුදල හෝ පොළිය සඳහා පමණක් සහන කාලය බලාපොරොත්තුවන්නේ නම් බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් එම සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම පරිදි එම සහන කාලය සලසා දිය හැකිය.

(ii) බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වලට සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුගේ එකඟතාවය පරිදි සහන කාලය තුලදී මුල් මුදල හෝ ගෙවීමට නියමිත පොළී මුදල හෝ ද්විත්වයෙන් අවස්ථාව අනුව අළුත් ණය පහසුකමක් බවට පරිවර්ථනය කිරීමට හෝ මූලික ණය මුදලේ කල්පිරෙන කාලය සහන කාල සීමාවට සමාන කාලයකින් දික් කිරීම සිදු කල හැකිය.

(iii) සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරු විසින් 2019 මැයි 21 දින නිකුත් කල සංචාරක කර්මාන්තය සඳහා සහන සලසාදීම දැක්වෙන 2019 අංක 01 දරන චක්‍රලේඛයේ සඳහන් වන කාල සීමාවට වඩා අඩු කාල සීමාවක් සඳහා සහන කාලයක් බලාපොරොත්තු වන්නේ නම් බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන වලට අඩු කාලසීමාවක් සඳහා සහන කාලය සලසා දිය හැකිය. කෙසේ වෙතත්, සහන කාල සීමාව තුල ගෙවීමට නියමිත මුල් මුදල, පොළී මුදල හෝ ද්විත්වයම නැවත ගෙවීම, අදාල සහන කාල සීමාව අවසානයේ සිට මාස තුනකට පසුව ආරම්භ විය යුතුය.

(iv) සහන කාල සීමාව තුල ගෙවීමට නියමිත මුල් මුදල, පොළී මුදල හෝ ද්විත්වයම නව ණය පහසුකමක් බවට පරිවර්තනය කරන අවස්ථාවේ දී බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් නැවත ගෙවන කාලය අවුරුදු 02 නොඉක්මවන අවස්ථා සඳහා අය කරන සහන පොළී අනුපාතය සහන කාල සීමාව අවසන් වන විට පැවති දින 364 භාණ්ඩාගාර බිල්පත් සඳහා වන ආසන්නතම වෙන්දේසි අනුපාතයට වාර්ෂිකව 2.5 %ට වඩා නොවැඩි විය යුතුය. නැවත ගෙවන කාලය අවුරුදු දෙක ඉක්මවන්නේ නම් බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ණය ගනුදෙනුකරුවන් අය කරන පොළී අනුපාතය සඳහා එකඟතාවයක් ඇති කර ගත යුතුය.

(v) බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් සහන සලසා ඇති සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් සහ ප්‍රතික්ෂේපිත ණය ගනුදෙනුකරුවන් පිළිබඳ විස්තර සෑම සිකුරාදායින් අවසන් වන සතියක් සඳහා සමුච්චිත පදනම මත ඇමුණුම I හා II සංශෝධිත ආකෘති පත්‍රයට අනුව ඊළඟ සතියේ බදාදා දින වාර්තා කල යුතුය.

ඇමුණුම I

2019 අංක 01 දරන චක්‍රලේඛය

**සංචාරක කර්මාන්තය සඳහා ලබා දී ඇති සහන ලබා ගැනීමට බලාපොරොත්තු වන ගනුදෙනුකරුවන්ගේ විස්තර**
**ආකෘති පත්‍රය 01 - ඉල්ලුම්කල/ පිරිනැමූ ගිවිසුම**

**බ.මු. සමාගමේ / වි. ක. මූ. සමාගමේ නම : ...................................................................**

**...................... වන සතිය අවසානයේදී**

| අනුක්‍රමික අංකය | ගිවිසුම් අංකය | ගනුදෙනුකරුගේ නම | 2019.04.18 දිනට ගෙවීමට ඇති මුදල (රු. '000) | සහන කාලය සඳහා සලකා බලන මුදල (රු. '000) | සහන කාල සීමාවේ ස්වාභාවය | සහන කාලයේ කාල සීමාව | සහන කාල සීමාව තුල ගෙවීමට ඇති මුදල් සඳහා පිරිනමන ලද නව ණය පහසුකම | | සහන කාලයේ තත්ත්වය | සටහන් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | ආපසු ගෙවන කාල සීමාව | පොලී අනුපාතය | | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

විස්තර :

4 වන තීරුව - අදාල දිනට ගිවිසුමේ සම්පූර්ණ නිරාවරණ මුදල (ගෙවීමට ඇති මුල් මුදල හා ගෙවීමට ඇති හිඟ ණය මුදල)
6 වන තීරුව - ණය පහසුකම ලබා දී ඇති කල්පිරෙන කාලය දීර්ඝ කිරීම (E), අළුත් ණය පහසුකමක් බවට පරිවර්තනය කිරීම - මුල් මුදල (C), පොලිය (I) හෝ ද්විත්වයම (CI)
7 වන තීරුව - සහන කාලයෙහි කාල සීමාව
9 වන තීරුව - නව පහසුකම සඳහා බලපාන පොලී අනුපාතය හෝ පොලී රහිත පහසුකම වාර්තා කිරීම
10 වන තීරුව - සහන කාලය ලබා දී ඇති බව හෝ අනුමත කිරීමේ ක්‍රියාවලිය යටතේ බව වාර්තා කිරීම.
11 වන තීරුව - අවශ්‍ය නම් අමතර විස්තර සපයන්න.

කරුණාකර ඊළඟ සතියේ බදාදා දින විද්‍යුත් තැපෑලෙන් dsnbfi@cbsl.lk වෙත ලැබීමට සලස්වන්න.

**2019 අංක 01 දරන චක්‍රලේඛය**

**සංචාරක කර්මාන්තය සඳහා ලබා දී ඇති සහන ලබා ගැනීමට බලාපොරොත්තු වන ගනුදෙනුකරුවන්ගේ විස්තර**
**ආකෘති පත්‍රය 02 - ප්‍රතික්ෂේපිත ඉල්ලුම්පත්‍ර**

**බ.මු. සමාගමේ / වි. ක. මූ. සමාගමේ නම : ..................................................................** **...................... වන සතිය අවසානයේදී**

| අනුක්‍රමික අංකය | ගිවිසුම් අංකය | ගනුදෙනුකරුගේ නම | 2019.04.18 දිනට ගෙවීමට ඇති මුදල (රු. '000) | සහන කාලය ලබා නොදීමට හේතු | සටහන් |
|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

විස්තර :

4 වන තීරුව - අදාල දිනට ගිවිසුමේ සම්පූර්ණ නිරාවරණ මුදල (ගෙවීමට ඇති මුල් මුදල හා ගෙවීමට ඇති හිඟ ණය මුදල)
6 වන තීරුව - අවශ්‍ය නම් අමතර විස්තර සපයන්න.

කරුණාකර ඊළඟ සතියේ බදාදා දින විද්‍යුත් තැපෑලෙන් dsnbfi@cbsl.lk වෙත ලැබීමට සලස්වන්න.